## ශ්‍රී ලාංකික ජනතාවගේ සහ දේශයේ සෞභාග්‍ය වෙනුවෙන් කැප වී සිටින අප සමඟ හවුල්කරුවකු වන්නට ඔබත් කැමතිද?

දිවයින පුරා 272 ක ශාඛා ජාලයකින් යුත් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම රාජ්‍ය සංවර්ධන බැංකුව වන ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ පුරප්පාඩුව ඇති පහත තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත විශිෂ්ට නායකත්ව හැකියාවකින් යුත් පළපුරුදු වෘත්තිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

# ප්‍රධාන තොරතුරු නිලධාරි

**ප්‍රධාන අවශ්‍යතා**

පහත සඳහන් සුදුසුකම් ලබා තිබිය යුතුය.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ ඉංජිනේරු හෝ තොරතුරු සන්නිවේදන තාක්ෂණ උපාධියක් සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් තිබීම.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් තොරතුරු සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් තිබීම කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

- තොරතුරු සන්නිවේදන තාක්ෂණ මෙහෙයුම් කටයුතු පිළිබඳ වසර 12 ක සමස්ත පළපුරුද්දක් සමඟ ඉන් අවම වශයෙන් වසර 08 ක ජ්‍යෙෂ්ඨ කළමනාකාර (ප්‍රධාන කළමනාකරණ සහ ඉන් ඉහළ, එයින් වසර 05ක් සහකාර සාමාන්‍යාධිකාරි හෝ ඉන් ඉහළ) මට්ටමේ පළපුරුද්දක් බැංකුවක හෝ මූල්‍ය ආයතනයක ලබා තිබීම.
- තොරතුරු සන්නිවේදන තාක්ෂණ කටයුතු පිළිබඳ ප්‍රවීනත්වය සහ නවීන බැංකුකරණ තාක්ෂණ ක්‍රමවේදයන් පිළිබඳ අවබෝධය
- බැංකු ව්‍යාපාර කටයුතු ස්වයංක්‍රීයකරණය කිරීම පිළිබඳ සංකල්පනාත්මක හැකියාවන් සහ ඒවා සංවර්ධනය කිරීමේ හැකියාවන් තිබිය යුතුය.
- වයස අවුරුදු 57 ට වඩා අඩු වීම.

**වැටුප් පරිමාව**

තෝරාගන්නා ලද අයදුම්කරු වෙත බැංකු ක්ෂේත්‍රයේ පවත්නා සම්මත, ආකර්ෂණීය දීමනාවන් සහිත වැටුපකට හිමිකම් කියනු ලබයි.

**අයදුම් කළ යුතු ආකාරය**

ජීව දත්ත තොරතුරු ඇතුළත් සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ විමසීම් තොරතුරු ද සහිත ව විෂය (Subject) තීරයේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කර, **2026 අප්‍රේල් 18** දින හෝ ඊට පෙර **careers@rdb.lk** ඊමේල් ලිපිනයට යොමු කරන්න.

ඉහත සඳහන් කරන ලද සුදුසුකම් සපුරාලීමට අසමත් වන හෝ වැරදි තොරතුරු ඇතුළත් අයදුම්පත් මෙම බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඕනෑම අවස්ථාවකදී කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තෝරාගත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ සහ මෙම බඳවාගැනීම කල් තැබීම හෝ අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුය.


ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
பிரதேச அபிவிருத்தி வங்கி
RDB Regional Development Bank

ප්‍රධාන මානව සම්පත් නිලධාරී,
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව,
අංක 933, නුවර පාර, වෙදමුල්ල, කැළණිය.
0112 03 54 54 | www.rdb.lk